# නවීකරණය සමාජ සංස්කෘතික වෙනස්වීම සඳහා බලපාන ආකාරය හා එහි ප්‍රතිවිපාක (දියගම ප්‍රදේශය ආශ්‍රයෙනි)

ටී. වයි. ඩී. වික්‍රමනායක, බී. ජී. ඒ. ටී. එන්. වික්‍රමරත්න, එච්. එම්. එච්. එම්. හේරත්, සේපාල සමරසේකර*
මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
*sepalasamarasekara@gmail.com

සාම්ප්‍රදායික සමාජයක් නවීන සමාජයක් දක්වා ගමන් කරීමේ ක්‍රියාවලිය නවීකරණයයි. නවීකරණය, සමාජ වෙනස්වීමේ කාරකයට අමතරව සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රකට ලක්ෂණයක් වශයෙන්ද හැඳින්විය හැක. විවිධ ව්‍යාපෘතීන් ස්ථානගත වීමත් සමග සමාජය නවීකරණය වී විශාල සමාජ සංස්කෘතික වෙනස්වීම් නිතැතින් සිදුවන්නේය. මෙලෙස සිදුවන සමාජ සංස්කෘතික වෙනස්වීම් පුද්ගල ජීවිතයට කරනු ලබන බලපෑම පිළිබඳ විමසීම මෙම අධ්‍යයනයේ අරමුණයි. හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දියගම බටහිර ප්‍රදේශයට අයත් නිවාසවලින් ආසන්න වශයෙන් 10%වන පරිදි අහඹු ලෙස තෝරාගත් නිවාස 40ක් නියැදිය වශයෙන් ගෙන සිදුකළ මෙම අධ්‍යයනයේදී දත්ත රැස්කිරීම සම්මුඛ පරීක්ෂණ උප ලේඛනයක් භාවිතයෙන් දත්ත දායකයා සමග සාකච්ඡා කරමින් සිදුකරනු ලැබීය. එසේම නිරීක්ෂණයෙන්, පොත්පත් හා අන්තර්ජාලය ආශ්‍රයෙන්ද දත්ත රැස්කරනු ලැබීය. වසර 14ක පමණ සිට මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩාංගනයත් මොරටුව විශ්ව විද්‍යාලීය තාක්ෂණ පීඨයත් හේතුවෙන් දියගම ප්‍රදේශය නවීකරණය වීම ආරම්භ විය. වත්මනේ මෙහි ජීවත්වන්නන්ගේ සමාජ සංස්කෘතික විපර්යාසයන්ට ප්‍රදේශයේ ඇති වූ නවීකරණය විශාල බලපෑමක් සිදුකරමින් පවතී. ගම්වැසියන්ට මෙමගින් රැකියා අවස්ථා රාශියක් හිමිවීමත්, ප්‍රදේශය පුරා මාර්ග සංවර්ධන, ජල, විදුලි ආදී ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක වීමත් ප්‍රදේශයේ ඉඩම්වල මිල ගණන් ඉහළ යාමත් සිදු වූ අතර එමගින් ජනතාව නව්‍යකරණයකට ලක්විය. ව්‍යාපෘති ආරම්භ වීමට ප්‍රථම ප්‍රදේශය පැවති වනාන්තරය විනාශ කිරීමෙන් ජල උල්පත් විනාශ වී ගම්වැසියන්ට ජලය මුදලට ගැනීමට සිදුවිය. ව්‍යාපෘති සඳහා පැමිණි නාගරික ප්‍රදේශවල පුද්ගලයින් මත්ද්‍රව්‍ය භාවිතා කිරීමත් තරුණ ප්‍රජාව පොළඹවා ගැනීමත් මෙම ප්‍රදේශයේ සමාජ සංස්කෘතික ව්‍යුහයට බලපෑම් කරයි. මාර්ග පුළුල් වී ප්‍රවාහනය සීඝ්‍රයෙන් වර්ධනය වීමත් ක්‍රීඩාංගනයේ උත්සව අවස්ථාවලදී පවතින අධික ඝෝෂාකාරී බවත් මෙම ප්‍රදේශයේ පැවති සාමකාමී නිදහස් පරිසරය විනාශ කර දමා ඇත. මෙහි ජීවත්වන්නන්ගෙන් 75%ක් පමණ වූ කහතුඩුව දක්ෂිණ අධිවේගී මාර්ගය හේතුවෙන් අවතැන්ව මෙම ප්‍රදේශයේ නැවත පදිංචිකරවූවන් වසර 10ක පමණ සිට ක්‍රීඩාංගණය අසල කුඩා වෙළඳ කුටි පවත්වාගෙන යාම සිදුකරයි. නමුත් යුධ හමුදාව පවත්වාගෙන යන වෙළඳ ඒකාධිකාරය ඔවුන්ට විශාල බලපෑමකි. කෙසේ වෙතත් මෙම ව්‍යාපෘති ආශ්‍රිත ව පවතින යුධ හමුදා වෙළඳ ඒකාධිකාරය නැතිකිරීමට කටයුතු කිරීමත්, සීඝ්‍රයෙන් වර්ධනය වන මත්ද්‍රව්‍ය උවදුරින් තරුණ පරපුර බේරා ගැනීමට රාජ්‍ය නිලධාරීන්ගේ ක්‍රියාශීලී මැදිහත්වීමත් පවතින්නේ නම් මෙම ව්‍යාපෘතීන්හි සාර්ථක ප්‍රතිපල ජනතාව අතරට බාධාවකින් තොරව ගමන් කරනා බව කිවමනාය. මේ ආකාරයට විවිධ ව්‍යාපෘතීන් හේතුවෙන් සිදු වූ සමාජ නවීකරණය සම්ප්‍රදායික සමාජය වෙනස් වීමකට භාජනය වී පැවති තත්ත්වයන්ට වඩා වෙනස් වූ සමාජ තත්ත්වයක් ඇතිවී ඇති බව අධ්‍යයනය මගින් අනාවරණය විය.

**ප්‍රමුඛ පද** නවීකරණය; සංස්කෘතිය; කාර්මීකරණය; නාගරීකරණය